# සී/ස ලංකා නැව් සංස්ථාව
# (වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය)

## ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පුරප්පාඩු පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### <u>අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර -JM 1-2, Gr. II ( ඇබෑර්තු 01 යි)</u>

.

**බාහිර අපේක්ෂකයින්: <u>සුදුසුකම්</u>:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණය හෝ වාණිජ්‍ය පිළිබඳ උපාධිය

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate level qualification)

**හෝ**

වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate level qualification)

**හෝ**

වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් (Intermediate level qualification)

**හෝ**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමාව (HNDA in Accountancy) -

**අභ්‍යන්තර අපේක්ෂකයින්: <u>සුදුසුකම්</u>:**

ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රීත නිලධාරි (MA 3) කාණ්ඩයේ අවම වශයෙන් පස් (05) වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ "කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන" (MA 1-2) කාණ්ඩයේ II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වැටුප් පරිමාණය :** JM 1-2 – 2025 : රු. (74,010 -10 ×1,360 -18× 2,040-124,330)

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව, තෝරාගත් අපේක්ෂකයා, JM 1-2 කාණ්ඩයේ II ශ්‍රේණියේ 2026.01.01 දිනට ආරම්භක වැටුප වන රු.66,781/- වන වැටුප් පියවරෙහි තබනු ලැබේ. මීට අමතරව රජය සතු ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

**වයස් සීමාව: -** වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පරිවාස කාලය :** බාහිර අයදුම්කරුවන් සඳහා අවුරුදු 03ක් සහ අභ්‍යන්තර අයදුම්කරවන් සඳහා වසර 1 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී පොලී අනුපාත මත වාහන ණය

## <u>පොදු උපදෙස්</u>

සියලුම අයදුම්පත් සමඟ අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික සහ උප්පැන්න සහතිකය හා අනෙකුත් අදාළ සහතිකවල පිටපත් **සාම විනිසුරුවරයෙකු (JP)/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කොට** සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් මෙම දැන්වීම පළවූ දින සිට දින 14ක් ඇතුළත හෝ ඊට ප්‍රථම සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව , නො.27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය) , කොළඹ 01** ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක 27, MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**
**කොළඹ 01**

වැඩි විස්තර සඳහා- 011 249 7800, 264/251/258 දිගු, මානව සම්පත් අංශය

දිනය : 2026.04.22